# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2017 අංක 23 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2017 ඔක්තෝබර් මස 19 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2017 ඔක්තෝබර් මස 20 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2017 අංක 23 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2017 ඔක්තෝබර් මස 19 වන දින]

එල්.ඩී.—ඕ. 45/2013

## 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මෙම පනත 2017 අංක 23 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ දීර්ඝ නාමයෙහි ඇති "රක්ෂණ මණ්ඩලයක් පිහිටුවීම පිණිස ද" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවක් පිහිටුවීම පිණිස ද" යන වචන ආදේශ කිරීමෙන් එම දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — 2000 අංක 43 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

**3.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක, "ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය" සහ (ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය පිළිබඳව සඳහන් වන) "මණ්ඩලය" යන වචන වෙනුවට පිළිවෙළින් "ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව" සහ "කොමිෂන් සභාව" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය. — ''ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය'' සහ ''මණ්ඩලය'' පිළිවෙළින් ''ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව'' සහ ''කොමිෂන් සභාව'' යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බව.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සහ එදිනට පසුව යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක, ආකෘති පත්‍රයක හෝ වෙනත් ලේඛනයක "ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයට" කරනු ලබන සෑම සඳහනක් ම "ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට" කරනු ලබන සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "එක් රක්ෂණ ව්‍යාපාරයක් හෝ රක්ෂණ ව්‍යාපාර පංති දෙකම" යන වචන වෙනුවට "සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක් හෝ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

2—PL 005395—2,862 (2017/08)

ප්‍රධාන ප්‍රඥප්තියේ 15ආ, 15ඇ සහ 15ඈ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15අ වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා එම ප්‍රඥප්තියේ 15ආ, 15ඇ සහ 15ඈ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:—

''යම් විදේශීය පාලක සමාගමක දේශීය පාලිත රක්ෂණ සමාගම.

15ආ. (1) 15අ වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද-

(අ) දේශීය පාලිත රක්ෂණ සමාගමේ කොටස්වලින් අවම වශයෙන් සියයට අසූපහක් ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටියා වූ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇති හා එම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය, විනිමය ස්ථාන පිළිබඳ ලෝක සම්මේලනයේ හෝ කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් යම් සංවිධානයක සාමාජිකයකු වන්නා වූ විදේශීය පාලක සමාගමක් විසින් දරනු ලබන බවට;

(ආ) එම දේශීය පාලිත රක්ෂණ සමාගමේ ගිණුම් විදේශීය පාලක සමාගමේ සමූහ ව්‍යාපාර ඒකාබද්ධ ගිණුම්වලට ඇතුළත් කර ඇති බවට; සහ

(ඇ) දේශීය පාලිත රක්ෂණ සමාගමේ ගිණුම්වලට අදාළ නියමයන් ඇතුළු එම විදේශීය පාලක සමාගම ලැයිස්තුගත කර ඇති විදේශීය ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයේ සියලු විධිමත් කිරීමේ නියමයන්ට සමූහ ව්‍යාපාර මට්ටමින් අනුකූල වන බවට සහතික විය යුතු බවට එම විදේශීය ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය මගින් එම විදේශීය පාලක සමාගමට නීත්‍යානුකූලව නියම කර ඇති බවට,

කොමිෂන් සභාව සෑහීමට පත්වීමෙන් පසු, එම දේශීය පාලිත රක්ෂණ සමාගම 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර ලබාදෙන ලද ව්‍යාපාර වස්තු

විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

ලැයිස්තුගත කිරීමෙන් නිදහස් කිරීම.

15ඇ. (1) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනතේ විධිවිධාන යටතේ පිහිටුවා ඇති ජාතික රක්ෂණ භාර අරමුදල 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ විධිවිධාන යටතේ බලපත්‍ර ලබාදෙන ලද ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව විසින්, යම් දේශීය පාලිත රක්ෂණ සමාගමක් 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර ලබා ඇති ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇති සමාගමක් විසින් දරනු ලබන බවට සෑහීමට පත්වීමෙන් පසුව එම දේශීය පාලිත රක්ෂණ සමාගම ඉහත කී පනතේ විධිවිධාන යටතේ බලපත්‍ර ලබාදෙන ලද ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීමෙන් නිදහස් කළ යුතු ය.

(3) (අ) සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හෝ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමාගම් දෙකක් බවට වෙන් කරනු ලැබීමෙන් පසු පිහිටුවන ලද යම් රක්ෂණ සමාගම්, එම වෙන් කිරීම සිදු කරනු ලැබූ දිනයේ දී එම සමාගම් සඳහා දී තිබූ නාමයන් කුමක් වුව ද 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර ලබාදෙන ලද ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කිරීමෙන් නිදහස් කළ යුතු ය.

(ආ) සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි හෝ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙන් වෙන් සමාගම් දෙකක් බවට පත් කරනු ලැබීමෙන් පසු පිහිටුවන ලද යම් රක්ෂණ සමාගම්වල හිමිකාරත්වය ශ්‍රී ලංකා

ආණ්ඩුව විසින් දරනු ලබන්නේ නම් මිස එවැනි කිසිදු නිදහස් කිරීමක් වලංගු නොවිය යුතු ය.

නියම හා කොන්දේසිවලට අනුකූලවීමේ යුතුකම.

15ඈ. (අ) යම් විදේශීය පාලක සමාගමක දේශීය පාලිත රක්ෂණ සමාගම;

(ආ) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද ජාතික රක්ෂණ භාර අරමුදල;

(ඇ) මෙම පනතේ 15ඇ වගන්තියේ (2) වන හා (3) වන උපවගන්තිවල සඳහන් අස්ථිත්වයන්,

විසින් කලින් කල කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසිවලට අනුකූල විය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

''(5) (අ) යම් තැනැත්තකු තැරැව්කරුවකුගේ හෝ රක්ෂණකරුවකුගේ රක්ෂණ නියෝජිතයකු ලෙස දැනටමත් ලියාපදිංචි වී ඇත්නම් එම තැනැත්තා තැරැව්කරුවකුගේ රක්ෂණ නියෝජිතයකු ලෙස පත්කරනු ලැබීමට නුසුදුස්සකු වන්නේ ය;

(ආ) යම් තැනැත්තකු තැරැව්කරුවකුගේ රක්ෂණ නියෝජිතයකු ලෙස දැනටමත් ලියාපදිංචි වී ඇත්නම් එම තැනැත්තා රක්ෂණකරුවකුගේ රක්ෂණ නියෝජිතයකු ලෙස පත්කරනු ලැබීමට නුසුදුස්සකු වන්නේ ය;

(ඇ) යම් තැනැත්තකු රක්ෂණ ව්‍යාපාරයේ යම් විශේෂිත පන්තියක් සඳහා රක්ෂණකරුවකුගේ රක්ෂණ

නියෝජිතයකු ලෙස දැනටමත් ලියාපදිංචි වී ඇත්නම් එම තැනැත්තා රක්ෂණ ව්‍යාපාරයේ එම පන්තිය සඳහා රක්ෂණකරුවකුගේ රක්ෂණ නියෝජිතයකු ලෙස පත් කරනු ලැබීමට නුසුදුස්සකු වන්නේ ය.".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 114 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 114 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "රක්ෂණ ව්‍යාපාර පන්ති" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන්:—

'' "රක්ෂණ ව්‍යාපාර පන්තිය" යන්නෙන්, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය හෝ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය අදහස් වේ;

"විදේශීය පාලක සමාගම" යන්නෙන්, යම් දේශීය පාලිත රක්ෂණ සමාගමක පාලක සමාගම වන ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරනු ලැබුවා වූ හෝ පිහිටුවනු ලැබුවා වූ යම් සමාගමක් හෝ සංස්ථාපිත මණ්ඩලයක් අදහස් වේ;"; සහ

(2) "පළාත් පාලන ආයතන ඇපය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:—

'' "දේශීය පාලිත රක්ෂණ සමාගම" යන්නෙන්, මේ පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යාමට ලියාපදිංචි වූ තැනැත්තකු අදහස් වන අතර ඊට මෙම පනතේ 113(2) වන වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සමාගමක් ද ඇතුළත් වේ ;".

**8.** (1) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුවම වූ දිනයේ පවත්නා වූ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සියලු ගිවිසුම්, එකඟවීම් සහ වෙනත් සාධන පත්‍ර මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් එළඹෙන ලද ගිවිසුම්, එකඟවීම් හෝ වෙනත් සාධන පත්‍ර වශයෙන් සලකනු ලැබිය යුතු ය. ව්‍යාවර්තන.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුවම වූ දිනයේ දී ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් හෝ ඊට විරුද්ධව පවරනු ලැබ, විනිශ්චයට භාජනව පවත්නා වූ සියලු සිවිල් නඩු, නඩු හා වෙනත් නඩු කටයුතු මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් හෝ ඊට විරුද්ධව පවරනු ලැබූ සිවිල් නඩු, නඩු සහ වෙනත් නඩු කටයුතු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සියලු අයිතිවාසිකම්, බැරකම් සහ බැඳීම් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අයිතිවාසිකම්, බැරකම් සහ බැඳීම් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(4) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙරාතුවම වූ දිනයේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වෙත පැවරී තිබූ සියලු චංචල හා නිශ්චල දේපළ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත පැවරිය යුතු ය.

(5) යම් නඩුවක දී හෝ නඩු කටයුත්තක දී ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ වාසියට හෝ ඊට විරුද්ධව යම් අධිකරණයක් විසින් සටහන් කරන ලද සෑම තීන්දු ප්‍රකාශයක්, ආඥාවක් හෝ නඩු තීන්දුවක් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ වාසියට හෝ ඊට විරුද්ධව සටහන් කරන ලද තීන්දු ප්‍රකාශයක්, ආඥාවක් හෝ නඩු තීන්දුවක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ තීන්දු ප්‍රකාශය, ආඥාව හෝ නඩු තීන්දුව ඒ අනුව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

**ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අනුප්‍රාප්තිකයා විය යුතු බව.**

**9.** සැක දුරු කිරීමේ කාර්ය සඳහා "ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව" සියලු කාර්ය සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද "ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ" අනුප්‍රාප්තිකයා ලෙස සලකනු ලැබිය යුතු ය.

**10.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**11.** 2011 අංක 3 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනතේ 53 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති වෙන් කිරීමේ නියමයන් සපුරාලීම නියම කර ඇති අවස්ථාවක එම නියමයන් සපුරාලීමෙන් පසු ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය යටතේ 2011 පෙබරවාරි මස 07 වන දින හෝ එදිනට පෙර නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් දරන යම් විදේශීය පාලක සමාගමක දේශීය පාලිත රක්ෂණ සමාගමකට මේ පනතේ 5 වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

දැනට සිටින රක්ෂණකරුවන්ට 5 වන වගන්තියේ අදාළත්වය පුළුල් කිරීම.